නිදහස් මාධ්‍ය ව්‍යාපාරය
சுதந்திர ஊடக இயக்கம்
FMM SRI LANKA Free Media Movement

# මාධ්‍ය නිදහසඃ නිරීක්ෂණ වාර්තාව
## ஊடக சுதந்திரம்ஃ கண்காணிப்பு அறிக்கை
## Media Freedom Rights Monitoring Report

MFRMD

2022 පෙබරවාරි
2 වන වෙළුම - කලාප අංක 2



මඩකලපුවේ මාධ්‍යවේදී දේවප්‍රදීපන්ට පහර දෙයි



සමාජ ක්‍රියාකාරික ෂෙහාන් මාලක ගමගේ අත්අඩංගුවට



මාධ්‍යවේදී චමුදිත සමරවික්‍රමගේ නිවසට ප්‍රහාරයක්

### අසාධාරණයන් නඩත්තු කිරීමේ සංස්කෘතිය

පෙබරවාරි මාසය තුළ නිරීක්ෂණය කළ මාධ්‍ය නිදහස පිළිබඳ උල්ලංඝනයන් සමාලෝචනය කිරීමේදී කැපී පෙනෙන ලක්ෂණය වූයේ 'හිතකර ආයතනික සංස්කෘතියක' ඌනතාවයි. පසුගිය දශක දෙක තුළ අපගේ නීති පද්ධතියට, ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූල, මානව හිමිකම් ආරක්ෂා කොට ප්‍රවර්ධනය කිරීමේ විවිධ යාන්ත්‍රණයන් හඳුන්වා දී තිබේ. එහෙත් එම යාන්ත්‍රණයන් සක්‍රියව පවත්වාගෙන යමින් යුක්තිය ඉටු කිරීමේ 'ආයතනික සංස්කෘතියක්' තවමත් වර්ධනය වී නොමැති බව පෙබරවාරි මාසයේ සිදුවීම්වලින් මැනවින් නිරීක්ෂණය විය.

මාධ්‍යවේදීන් හා ක්‍රියාකාරිකයින් නිහඬ කිරීම පිණිස ශාරීරික අඩන්තේට්ටම් කිරීම, අන්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම, අත්අඩංගුවට ගත් කාරණයට හාත්පසින්ම වෙනස් කාරණයක් මත අධිකරණයට ඉදිරිපත් කිරීම, කිසිදු නඩු කටයුත්තකින් තොරව කාලයකට පසු චෝදනා ඉවත් කර ගැනීම යන සියල්ල මගින් අවබෝධ වන්නේ අයුක්තිය අවිච්ඡින්නව පවත්වා ගෙන යන ආයතන ව්‍යුහයක් හා සංස්කෘතියක් අප මත බලහත්කාරයෙන් පටවා ඇති බවයි.

මේ නිසා නිදහස් මාධ්‍ය සංස්කෘතියක් පිළිබඳ අරගලය හුදෙක් මාධ්‍ය නිදහස ප්‍රවර්ධන කිරීම පමණක් නොව මාධ්‍ය නිදහසේ විවිධ පැතිකඩයන් උල්ලංඝනය කරන ආයතන එම ආයතන හා අරමුණු සාධනය කරන 'වැඩ සංස්කෘතියක්' ප්‍රතිනිර්මාණය කර ගැනීම කෙරෙහි යොමු කිරීම වැදගත් වෙයි.

**නිදහස් මාධ්‍ය ව්‍යාපාරය**

**මාධ්‍ය නිදහසට අදාළව ඒ ඒ මාසය තුළ වාර්තා වන සිදුවීම්, පූර්ව සිදුවීම්වල වර්ධනයන් හා ඒවාට අදාළ නිරීක්ෂණ මෙම වාර්තාවට ඇතුළත් වේ. මාධ්‍යවේදීන්ගේ මෙන්ම ජනතාවගේ භාෂණයේ හා අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සම්බන්ධ සිදුවීම්, නව නීති පැනවීම්, නීති ප්‍රතිසංස්කරණ සහ අදාළ ප්‍රස්තුතයන් පිළිබඳව ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පළ වන ප්‍රතිචාර යනාදිය කෙරෙහිද මෙහිදී අවධානය යොමු කෙරේ. මාධ්‍ය නිදහස පිළිබඳව නිරීක්ෂණය කිරීම සඳහා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය තෝරාගෙන ඇති විෂය පථයට / සංරචකයන්ට අදාළ සිදුවීම් 15ක් 2022 පෙබරවාරි මාසයේදී නිරීක්ෂණය විය. මාධ්‍යවේදීන්ගේ හා ක්‍රියාකාරිකයන්ගේ ආරක්ෂාව හා සුරක්ෂිතබවට අදාළ සිදුවීම් 5ක්, නීතිමය කොන්දේසි යන සංරචකය යටතට ගැනෙන සිදුවීම් 6ක්, ව්‍යුහාත්මක කොන්දේසි යටතට ගැනෙන සිදුවීම් 4ක් ඒ අතර වෙයි.**

## නිරීක්ෂණය වූ සිදුවීම්

1. අම්බිකා සත්කුනනාදන් යුරෝපා පාර්ලිමේන්තුවේ අනු කමිටුව හමුවේ කළ අදහස් දැක්වීම විවේචනයට ලක් කරමින් ශ්‍රී ලංකාවේ විදේශ අමාත්‍යාංශය නිවේදනයක් නිකුත් කිරීම හා සිවිල් සමාජය එම නිවේදනයට විරෝධය පළ කිරීම.
2. පෙබරවාරි 04 වැනිදා පැවැත්වීමට නියමිතව තිබූ බව කියන පෙළපාළියක් තහනම් කිරීමේ අධිකරණ නියෝගයක්, පොලිසිය මඩකලපුවේ නිදහස් මාධ්‍යවේදී පුණ්‍යමූර්ති සසිදරන්ට එරෙහිව ලබා ගැනීම.
3. 'ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පතට' විරෝධය පළ කරමින් සිවිල් සංවිධාන 32ක් සහ පුරවැසියන් 70 දෙනෙක් ඒකාබද්ධ නිවේදනයක් නිකුත් කිරීම.
4. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ මාස 22ක කාලයක් රැඳවුම් භාරයේ සිටි නීතිඥ හිජාස් හිස්බුල්ලා ඇප මත නිදහස් කිරීමට අභියාචනාධිකරණය නියෝග කිරීම.
5. යෝජිත 'දත්ත ආරක්ෂණ පනත' සංශෝධනය කිරීම සඳහා මැදිහත් වන ලෙස ශ්‍රී ලංකා තරුණ ජනමාධ්‍යවේදීන්ගේ සංගමය අදහස් දැක්වීමේ සහ ප්‍රකාශනයේ නිදහස පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරුගෙන් ඉල්ලා සිටීම.
6. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ මාස 5කට අධික කාලයක් රඳවා සිටි ලංකා ඊ නිව්ස් මාධ්‍යවේදී කීර්ති රත්නායක ඇප මත මුදාහැරීමට කොටුව මහේස්ත්‍රාත්වරයා නියෝග කිරීම.
7. ගවේෂණාත්මක වාර්තාකරණයක් හේතුවෙන් එල්ල වූ තර්ජනයක් පිළිබඳව මාධ්‍යවේදී රාහුල් සමන්ත හෙට්ටිආරච්චි පොලිසියට පැමිණිලි කිරීම.
8. LGBTIQA+ ප්‍රජාවට අදාළ මාධ්‍ය ආචාරධර්ම පිළිබඳව ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමය විසින් සංවිධානය කළ මාර්ගගත සංවාදයක් ජනමාධ්‍යවේදීන් උදෙසා පැවැත්වීම.
9. මාධ්‍යවේදී චමුදිත සමරවික්‍රමගේ නිවසට, නාඳුනන පුද්ගලයින් කණ්ඩායමක් ගල් සහ අසූචි ප්‍රහාරයක් එල්ල කිරීම.
10. සමාජ මාධ්‍ය ක්‍රියාකාරික මනෝරම වීරසිංහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවීම.
11. සමාජ ක්‍රියාකාරික ෂෙහාන් මාලක ගමගේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අත්අඩංගුවට ගනු ලැබීම.
12. ජනමාධ්‍යයට එරෙහි අපරාධවලට යුක්තිය ඉටු නොකිරීම සම්බන්ධයෙන් උතුරේ මාධ්‍යවේදීන් ජනමාධ්‍ය ඇමතිවරයාට විරෝධය පළ කිරීම.
13. ජනමාධ්‍යවේදීන්ට හා ක්‍රියාකාරිකයන්ට එල්ල වන තර්ජන වර්ධනය වීම පිළිබඳව විපක්ෂ නායකවරයා පාර්ලිමේන්තුවේදී විශේෂ ප්‍රකාශයක් කිරීම.
14. මඩකලපුවේ මාධ්‍යවේදී ලක්ෂ්මනන් දේවප්‍රදීපන් වාර්තාකරණයක නිරතව සිටියදී දේශපාලනඥයකුගේ ආධාරකරුවකුගේ ප්‍රහාරයට ලක් වීම.
15. මාධ්‍යවේදී නිමලරාජන් ඝාතනයට සම්බන්ධ සැකකරුවෙකු බ්‍රිතාන්‍ය පොලිසිය මගින් අත්අඩංගුවට ගැනීම.

**1 වගුව: වාර්තා වූ සමස්ත සිදුවීම් - 2022 පෙබරවාරි**

| ආවරණය කර ඇති සංරචකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| ආරක්ෂාව සහ සුරක්ෂිතබව | 05 |
| නීතිමය කොන්දේසි | 06 |
| ව්‍යුහාත්මක කොන්දේසි | 04 |
| **එකතුව** | **15** |

## ආරක්ෂාව සහ සුරක්ෂිතබව

**මාධ්‍යවේදීන්ට තම වෘත්තිය ශාරීරික සහ මානසික ඒකාග්‍රතාවකින් යුක්තව නිදහස් ලෙස කර ගෙන යෑමේ වාතාවරණයක් පැවතීම ජනමාධ්‍ය නිදහස පිළිබඳ මූලික කොන්දේසියකි. එමෙන්ම ජනමාධ්‍ය නිදහස හා අදහස් පළ කිරීමේ නිදහස ආරක්ෂා වීමට නම්, පුරවැසියන්ට අහිතකර ප්‍රතිවිපාකවලට මුහුණදීමේ අවදානමකින් තොරව ජනමාධ්‍ය ඔස්සේ හෝ වෙනත් ආකාරවලින් නිදහසේ අදහස් පළ කළ හැකි වාතාවරණයක් පැවතිය යුතුය. සාමකාමීව රැස්වීමේ, විරෝධය පළ කිරීමේ හා උද්ඝෝෂණවල නිරත වීමේ නිදහසද අදහස් පළ කිරීමේ නිදහසට අයත් වේ. මෙම මූලික නිදහස උල්ලංඝනය වූ අවස්ථා 5ක් පෙබරවාරි මාසයේදී වාර්තා විය. මාධ්‍යවේදී චමුදිත සමරවික්‍රමගේ නිවසට ප්‍රහාරයක් එල්ල වීම හා ඒ සම්බන්ධයෙන් සිදු කෙරෙන පරීක්ෂණවල ප්‍රගතියක් දක්නට නොලැබීම මාධ්‍ය නිදහසට පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශ්වවල දැඩි අවධානයට ලක්ව තිබේ.**

**2 වගුව: 2022 පෙබරවාරි: මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව සහ සුරක්ෂිතබව - සිදුවීම් 05**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| ප්‍රහාර | 02 |
| මානසික බලපෑම් | 03 |
| **එකතුව** | **05** |

1. **අම්බිකා සත්කුනනාදන් යුරෝපා පාර්ලිමේන්තුවේ අනු කමිටුව හමුවේ කළ අදහස් දැක්වීම විවේචනයට ලක් කරමින් ශ්‍රී ලංකාවේ විදේශ අමාත්‍යාංශය නිවේදනයක් නිකුත් කිරීම හා සිවිල් සමාජය එම නිවේදනයට විරෝධය පළ කිරීම.**

   ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ හිටපු කොමසාරිස්වරියක හා මානව හිමිකම් ක්‍රියාකාරිනියක වන නීතිඥ අම්බිකා සත්කුනනාදන් ජනවාරි 27 වැනිදා යුරෝපා පාර්ලිමේන්තුවේ මානව හිමිකම් සම්බන්ධයෙන් වන අනු කමිටුව හමුවේ කළ ප්‍රකාශය[1] දැඩි විවේචනයට ලක් කරමින් ශ්‍රී ලංකාවේ විදේශ අමාත්‍යාංශය නිවේදනයක් නිකුත් කළේය.[2]

   විදේශ අමාත්‍යාංශයේ එම නිවේදනයට ප්‍රතිචාර දක්වමින් සිවිල් සමාජ සංවිධාන 47ක් සහ සිවිල් පුරවැසියන් 167 දෙනෙකු සාමූහික නිවේදනයක් නිකුත් කර තිබේ. 'මානව හිමිකම් ක්‍රියාකාරිනියකගේ සහ පර්යේෂකයෙකුගේ ස්වාධීන උද්දේශනය, එල්.ටී.ටී.ඊ.යේ ක්‍රියාකාරකම් හා බැඳි තත්ත්වයන් සමඟ සම තත්ත්වයෙහිලා සංසන්දයක් කිරීමට විදේශ අමාත්‍යාංශය විසින් ගන්නා උත්සහය හුදෙක් අසාධාරණ මෙන්ම දුෂ්ට හා බියකරු' බව එම ප්‍රකාශනය අවධාරණය කරයි.[3]

   මූලාශ: 1 https://multimedia.europarl.europa.eu

   2. https://island.lk

   3. https://www.ceylonnews.lk

2. **ගවේෂණාත්මක වාර්තාකරණයක් හේතුවෙන් එල්ල වූ තර්ජනයක් පිළිබඳව මාධ්‍යවේදී රාහුල් සමන්ත හෙට්ටිආරච්චි පොලිසියට පැමිණිලි කිරීම.**

   හම්බන්තොට දිස්ත්‍රික්කයේ වගා කළ හැකි කුඹුරු ඉඩම් ගොඩ කිරීම සම්බන්ධයෙන් පළ කළ ගවේෂණාත්මක ලිපියක් හේතුවෙන් තමන්ට දුරකථනයෙන් කළ තර්ජනයක් පිළිබඳව පදිංචිව මාධ්‍යවේදී රාහුල් පෙබරවාරි 08 වැනිදා හම්බන්තොට පොලිසියට පැමිණිලි කර තිබේ.

   තොරතුරු දැනගැනීමේ පනත මගින් ලබාගත් තොරතුරු මත අදාළ වාර්තාව ලියා ඇති අතර හම්බන්තොට තවලවිල්ල සහ පුබුල්ඔය යන ප්‍රදේශවල වගා කළ හැකි කුඹුරු අනවසරයෙන් ගොඩකිරීම සම්බන්ධයෙන් බලධාරීන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවත් එමගින් පෙන්වා දී ඇත.

   මූලාශ්‍රය: FMM Media Rights Monitoring Desk

3. **මාධ්‍යවේදී චමුදිත සමරවික්‍රමගේ නිවසට, නාඳුනන පුද්ගලයින් කණ්ඩායමක් ගල් සහ අසූචි ප්‍රහාරයක් එල්ල කිරීම.**

   මාධ්‍යවේදී චමුදිත සමරවික්‍රම පදිංචිව සිටින පිළියන්දල කේම්බ්‍රිජ් කෝට් නිවාස සංකීර්ණයේ පිහිටි නිවසට පෙබ. 14 වැනිදා අලුයම මෙම ප්‍රහාරය එල්ල වී ඇති අතර මුහුණු ආවරණය කරගත් තිදෙනෙකු ප්‍රහාරය එල්ල කරන අයුරු සීසීටීවී දර්ශනවල සටහන්ව තිබේ. සිද්ධිය සම්බන්ධයෙන් විමර්ශනය කිරීමට පොලිස්පතිවරයාගේ උපදෙස් පරිදි පොලිස් කණ්ඩායම් 9ක් පත් කර ඇතැයි පොලිසිය නිවේදනය කළේය.

   සිදුවීමෙන් දින 4කට පසුව, තම ආරක්ෂාව සහතික කරන ලෙස ඉල්ලා මාධ්‍යවේදී චමුදිත අධිකරණයට මෝසමක් ඉදිරිපත් කළ අතර, ඔහුට සහ පවුලේ අයට නිසි ආරක්ෂාවක් සලසන ලෙස කැස්බෑව මහේස්ත්‍රාත් අධිකරණය, සාක්ෂිකරුවන් හා වින්දිතයන් ආරක්ෂා කිරීමේ පොලිස් කොට්ඨාසයට නියෝග කළේය. නිදහස්

මාධ්‍ය ව්‍යාපාරය ඇතුළු මාධ්‍ය සංවිධාන හා සිවිල් සංවිධාන රැසක් ප්‍රහාරය හෙළා දකිමින් නිවේදන නිකුත් කළේය.

මූලාශ්‍ර: 1. https://www.youtube.com

2.https://newshub.lk

4. **සමාජ මාධ්‍ය ක්‍රියාකාරික මනෝරම වීරසිංහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවීම.**

'සමාජ ජාලා සම්බන්ධයෙන් සිදු කෙරෙන විමර්ශනයකට අදාළව ප්‍රකාශයක් ලබා ගැනීම සඳහා' පෙබරවාරි 17 වැනිදා පෙ.ව. 9.00ට කොළඹ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හමුවේ පෙනී සිටින ලෙස පෙබ. 14 වැනිදා ඔහුට දැනුම් දී තිබුණු අතර විමර්ශනය කවර කරුණක් පිළිබඳවදැයි දැනුවත් කර නැත.

17 වැනිදා මනෝරම වීරසිංහ ඔහුගේ නීතිඥවරුන් මාර්ගයෙන් තමන් කැඳවීමට හේතුව විමසා අපාරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලිපියක් යොමු කර තිබේ.

මූලාශ්‍රය: https://www.newsfirst.lk

5. **මඩකලපුවේ මාධ්‍යවේදී ලක්ෂ්මනන් දේවප්‍රදීපන් වාර්තාකරණයක නිරතව සිටියදී දේශපාලනඥයකුගේ ආධාරකරුවකුගේ ප්‍රහාරයට ලක් වීම.**

IBC දෙමළ වෙබ් අඩවියේ මාධ්‍යවේදියකු වන ලක්ෂ්මනන්ට පෙබ. 26 වැනිදා මෙම ප්‍රහාරය එල්ල වී ඇත්තේ වන්තාරුමුලෙයි ප්‍රදේශයේ බස් නැවතුම්පොළක් ඉවත් කිරීම සම්බන්ධයෙන් ඇති වූ උණුසුම් තත්ත්වයක් ජංගම දුරකථනයෙන් වීඩියෝගත කරමින් සිටියදීය. ප්‍රහාරයෙන් සිදු වූ හානි හේතුවෙන් ඔහු දින කිහිපයක් වෙන්කලාඩි රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබාගෙන ඇති අතර අදාළ සැකකරු පොලිසිය මගින් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කරන ලදුව මාර්තු 04වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාරගත කෙරිණ.

මූලාශ්‍ර: 1. FMM Media Rights Monitoring Desk

2. http://www.battinews.com

## නීතිමය කොන්දේසි

**මාධ්‍ය නිදහසට අදාළව නීතිමය කොන්දේසි පිළිබඳ සංරචකය යටතට ගැනෙන සිදුවීම් 6ක් ජනවාරි මාසය තුළ නිරීක්ෂණය විය. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත තියුණු සංවාදයකට නිමිති වී තිබෙන පසුබිමක, එම පනත යටතේ අත්අඩංගුවේ පසු වූ මාධ්‍යවේදියකුට හා ක්‍රියාකාරිකයකුට අධිකරණයෙන් ඇප නියම කිරීම කැපී පෙනෙන සිදුවීමකි. නිමලරාජන් ඝාතනයේ සැකකරුවකු බ්‍රිතාන්‍යයේදී අත්අඩංගුවට පත්වීම මානව හිමිකම් ක්ෂේත්‍රයේ ප්‍රසාදයට හේතු වී තිබේ.**

**3 වගුව: 2022 පෙබරවාරි : නීතිමය කොන්දේසි - සිදුවීම් 06**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| නීතිමය ක්‍රියාමාර්ග | 05 |
| මාධ්‍යවේදීන්ට එරෙහි අපරාධ පිළිබඳ දණ්ඩමුක්තිය | 01 |
| **එකතුව** | **06** |

1. **පෙබරවාරි 04 වැනිදා පැවැත්වීමට නියමිතව තිබූ බව කියන පෙළපාලියක් තහනම් කිරීමේ අධිකරණ නියෝගයක්, පොලිසිය මඩකලපුවේ නිදහස් මාධ්‍යවේදී පුණ්‍යමූර්ති සසිදරන්ට එරෙහිව ලබා ගැනීම.**

ශ්‍රී ලංකාවේ 74 වැනි නිදහස් දිනයට විරෝධය පළ කරමින් කල්ලඩි පාලමේ සිට ගාන්ධි උද්‍යානය දක්වා විරෝධතා පෙළපාලි පැවැත්වෙන බවට පොලිසිය විසින් කරන ලද දැනුම්දීමකට අනුව මඩකළපුව මහේස්ත්‍රාත් අධිකරණය විසින් AR/211/2021/ දරන නඩුව යටතේ අපරාධ නඩු විධාන සංග්‍රහයේ 106 (1) වගන්තිය අනුව මෙම වාරණ නියෝගය නිකුත් කර ඇත. එහෙත් එවැනි විරෝධතා පෙළපාලියක් නොපැවැත්වුණු අතර තමන් එවැනි කටයුත්තකට සම්බන්ධයක් නොමැති බවද සසිදරන් පවසයි.

අ2021 වසරේ සිට මේ දක්වා තමන්ට එරෙහිව අධිකරණයෙන් තහනම් නියෝග 13ක් පනවා ඇති බවත්, විමර්ශනය කිරීම් සඳහා සහකාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි කාර්යාලයට තුන් වතාවක් ඔහුව කැඳවා ඇති බවත් හා දෙවතාවක් බුද්ධි අංශ නියෝජිතයින් නිවසට පැමිණ ප්‍රශ්න කළ බවත් නිදහස් මාධ්‍යවේදියකු හා සමාජ ක්‍රියාකාරිකයකු වන සසිදරන් නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ මාධ්‍ය අයිතීන් පිළිබඳ නිරීක්ෂණ ඒකකයට පැවසීය.

මූලාශ්‍රය: 1. FMM Media Rights Monitoring Desk
2. https://twitter.com

2. **ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ මාස 22ක කාලයක් රැඳවුම් භාරයේ සිටි නීතිඥ හිජාස් හිස්බුල්ලා ඇප මත නිදහස් කිරීමට අභියාචනාධිකරණය නියෝග කිරීම.**

තමන් ඇප මත නිදහස් කරන ලෙස ඉල්ලා නීතිඥ හිස්බුල්ලා ගොනු කර තිබූ ප්‍රතිශෝධය අයදුම්පත සලකා බැලූ අභියාචනාධිකරණය පෙබරවාරි 07 වැනිදා මෙම නියෝගය නිකුත් කළේය. පාස්කු ප්‍රහාරයට අනුබල දීමේ චෝදනාව මත, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ 2020 අප්‍රේල් 14වැනිදා නීතිඥ හිස්බුල්ලා අත්අඩංගුවට ගෙන රැඳවුම් භාරයට පත් කෙරුණු අතර මාස 18ක කාලයක් එලෙස රඳවාගෙන සිටීමෙන් පසුවද ඒ සම්බන්ධයෙන් අධිකරණය ඉදිරියේ චෝදනා ගොනු කිරීමට පොලිසිය අසමත් විය. පසුව ඔහුට එරෙහිව පුත්තලම මහාධිකරණය ඉදිරියේ අධිචෝදනා ගොනු කෙරුණේ, පුත්තලම ප්‍රදේශයේ මද්‍රසා පාසලක සිසුන්ට අන්තවාදී දේශන පැවැත්වීමේ චෝදනාවක් සම්බන්ධයෙනි.

නීතිඥ හිස්බුල්ලා අත්අඩංගුවට ගැනීම, දේශීය හා ජාත්‍යන්තර මානව හිමිකම් ආරක්ෂකයින්ගේ දැඩි විරෝධයට හේතු වූ අතර එය ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතෙහි බිහිසුණු ස්වභාවය හෙළි කරන නිදර්ශනයක් ලෙසද අවධානයට ලක් විය.

මූලාශ්‍ර: 1. https://ceylontoday.lk
2. https://www.bbc.com

3. **ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ මාස 5කට අධික කාලයක් රඳවා සිටි ලංකා ඊ නිව්ස් මාධ්‍යවේදී කීර්ති රත්නායක ඇප මත මුදාහැරීමට කොටුව මහේස්ත්‍රාත්වරයා නියෝග කිරීම.**

කොළඹ පිහිටි ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයට ත්‍රස්ත ප්‍රහාරයක් එල්ල වීමේ අවදානමක් ඇති බවට කළ දැනුම්දීමක් හේතුවෙන්, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ 2021 අගෝස්තු 14 වැනිදා ඔහු අත්අඩංගුවට ගැනුණු අතර මාස 5ක කාලයක් තිස්සේ ඔහුට එරෙහිව අධිකරණය ඉදිරියේ චෝදනා ගොනු කිරීමට පොලිසිය සමත් වී නැත. අත්අඩංගුවට ගෙන රඳවා තබාගැනීමට එරෙහිව කීර්ති රත්නායක විසින් ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ මූලික අයිතිවාසිකම් පෙත්සමක්ද ගොනු කරනු ලැබ තිබේ.

මෙම අත්අඩංගුවට ගැනීම ජාතික හා ජාත්‍යන්තර මාධ්‍ය සංවිධාන හා සිවිල් සංවිධානවල දැඩි විරෝධයට හේතු විය.

මූලාශ්‍ර: 1. https://www.dailymirror.lk
2. https://sinhala.srilankabrief.org

4. **සමාජ ක්‍රියාකාරික ෂෙහාන් මාලක ගමගේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අත්අඩංගුවට ගනු ලැබීම.**

පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් යුක්තිය උදෙසා හඬ නගන සමාජ ක්‍රියාකාරිකයකු වන ෂෙහාන් මාලක ගමගේ පෙබ. 14 වැනිදා පානදුර ප්‍රදේශයේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගන්නා ලදි. ඒ අවස්ථාවේදී ඔහු ෆේස්බුක් ලයිව් ඔස්සේ ප්‍රකාශ කළේ, පොලිසියෙන් යැයි කියන පිරිසක් සුදු වෑන් රථයකින් මහමගදී තමන් පැහැරගන්නා බවයි. පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් කරන ලද ප්‍රකාශයකට අදාළව නීතිපතිවරයාගේ උපදෙස් මත ඔහු අත්අඩංගුවට ගත් බව පසුව පොලිසිය තහවුරු කළේය.

පෙබ. 15 වැනිදා මාලිගාකන්ද මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඔහු ඇප මත මුදාහැරීමට නියෝග කෙරිණි.

මෙම අත්අඩංගුවට ගැනීම හා එය සිදු කළ ආකාරය සම්බන්ධයෙන් කතෝලික සභාව සහ තවත් පාර්ශ්ව රැසක් විරෝධය පළ කළේය.

මූලාශ්‍ර: 1. https://www.facebook.com
2. https://www.bbc.com

5. **මාධ්‍යවේදී නිමලරාජන් ඝාතනයට සම්බන්ධ සැකකරුවෙකු බ්‍රිතාන්‍ය පොලිසිය මගින් අත්අඩංගුවට ගැනීම.**

2000 වසරේ යාපනයේදී සිදු වූ මාධ්‍යවේදී මයිල්වාගනම් නිමලරාජන් ඝාතනයට සම්බන්ධ සැකකරුවකු බ්‍රිතාන්‍ය මෙට්‍රොපොලිටන් පොලිසියේ යුද අපරාධ ඒකකය විසින් පෙබරවාරි 22 වැනිදා අත්අඩංගුවට ගෙන තිබේ. 48 හැවිරිදි සැකකරුගේ අනන්‍යතාව නිල වශයෙන් ප්‍රකාශ කර නැතත්, ඔහු බ්‍රිතාන්‍යයට පලා ගිය බවට වාර්තා වූ ප්‍රධාන සැකකරු වන සෙබස්තියන්පිල්ලෙයි රමේෂ් හෙවත් නැපෝලියන් නැමති අය බව මාධ්‍ය වාර්තා සඳහන් කර තිබේ. නිමලරාජන් ඝාතනය සම්බන්ධයෙන් ඔහු අත්අඩංගුවට ගැනීමට 3003 මාර්තු 27 වැනිදා යාපනය මහේස්ත්‍රාත්වරයා නියෝග කර තිබූ අතර, පසුව සැකකරු ප්‍රබල දේශපාලනඥයකුගේ රැකවරණය මත බ්‍රිතාන්‍යයට පලාගිය බව වාර්තා විය.

2001 ජාත්‍යන්තර අපරාධ අධිකරණ පනතේ ජන සංහාර, මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ සහ යුද අපරාධ ආවරණය වන 51 වැනි වගන්තිය යටතේ වැරදි සම්බන්ධයෙන් සැකපිට ඔහු අත්අඩංගුවට ගෙන ඇති අතර පසුව

විමර්ශන යටතේ නිදහස් කර ඇත. විමර්ශන අඛණ්ඩව සිදුවන අතර, ඒ සඳහා සහාය විය හැකි තොරතුරු ලබා දෙන ලෙස පොලිසිය නිවේදනය කරයි.

මෙම අත්අඩංගුවට ගැනීම මානව හිමිකම් ආරක්ෂකයින්ගේ පැසසුමට ලක්ව තිබේ.

මූලාශ්‍ර: 1. https://island.lk
2. https://news.met.police.uk
3. https://redress.org/news

6. **ජනමාධ්‍යයට එරෙහි අපරාධවලට යුක්තිය ඉටු නොකිරීම සම්බන්ධයෙන් උතුරේ මාධ්‍යවේදීන් ජනමාධ්‍ය ඇමතිවරයාට විරෝධය පළ කිරීම.**

යාපනය දිස්ත්‍රිකක් ලේකම් කාර්යාලය තුළ ස්ථාපනය කළ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ යාපනය දිස්ත්‍රික් ප්‍රකාශන කාර්යාංශය විවෘත කිරීමේ උත්සවය සඳහා ඇමතිවරයා පෙබ. 17 වැනිදා යාපනයට පැමිණි අවස්ථාවේදී මෙම විරෝධය එල්ල විය. 2001-2010 කාලසීමාවට අදාළව JDS සංවිධානය මගින් නිකුත් කෙරුණු වාර්තාවකට අනුව එම දශකයේ දී ශ්‍රී ලංකාව තුළ ඝාතනය කෙරුණු හා අතුරුදහන් කෙරුණු මාධ්‍යවේදීන් සහ මාධ්‍ය සේවකයන්ගේ සංඛ්‍යාව 44ක් බවත් ඉන් බහුතරය උතුරු, නැගෙනහිර දෙමළ මාධ්‍යවේදීන් බවත් එම සිදුවීම් කිසිවක් සම්බන්ධයෙන් යුක්තිය ඉටු වී නොමැති බවත් මාධ්‍යවේදීන් එහිදී පෙන්වා දී තිබේ. අදාළ උත්සව අවස්ථාව ආවරණය කිරීම සඳහා කළු පැහැති කාඩ්පතක් පැළඳගෙන පැමිණීමෙන් මාධ්‍යවේදීන්ගේ විරෝධය සංකේතවත් කෙරිණි.

මූලාශ්‍රය: https://www.aithiya.lk

## වියුහාත්මක කොන්දේසි

**'වියුහාත්මක කොන්දේසි' යන්න මාධ්‍ය නිදහස පිළිබඳව සලකා බැලෙන වැදගත් සංරචකයකි. මාධ්‍ය පද්ධතියේ සමස්ත ව්‍යුහයට මෙන්ම මාධ්‍ය නිදහස සක්‍රිය කරන සමස්ත පරිසරයට අදාළ වන විභව දර්ශක 6ක් මෙම මානයට ඇතුළත්ය. ඒ අතරින් 'අධීක්ෂණ කණ්ඩායම් මගින් මාධ්‍ය නිදහසට ක්‍රියාකාරී සහාය' යන දර්ශකයට අයත් වන අවස්ථා 3ක් සහ 'මාධ්‍ය ආචාරධර්ම' යන දර්ශකය යටතට ගැනෙන එක් අවස්ථාවක් පෙබරවාරි මාසයේදී නිරීක්ෂණය විය.**

**4 වගුව: 2022 පෙබරවාරි: ව්‍යුහාත්මක කොන්දේසි - සිදුවීම් 04**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| අධීක්ෂණ කණ්ඩායම් මගින් මාධ්‍ය නිදහසට ක්‍රියාකාරී සහාය | 03 |
| මාධ්‍ය ආචාරධර්ම | 01 |
| **එකතුව** | **04** |

1. **'ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පතට' විරෝධය පළ කරමින් සිවිල් සංවිධාන 32ක් සහ පුරවැසියන් 70 දෙනෙක් ඒකාබද්ධ නිවේදනයක් නිකුත් කිරීම.**

ශ්‍රී ලංකා රජය විසින් 2022 ජනවාරි 27 දා ගැසට් මගින් ප්‍රකාශයට පත්කරන ලද 'ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පතට' විරෝධය පළ කරමින් මෙම නිවේදනය නිකුත් කර තිබේ. යෝජිත සංශෝධන මගින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිදුවන භයානක මානව හිමිකම් උල්ලංඝනයන් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවත් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ඓතිහාසික වශයෙන්ම භාවිතා කර තිබෙන්නේ දෙමළ ජනතාවට එරෙහිව, පාස්කු ඉරු දින ත්‍රස්ත ප්‍රහාරවලින් පසු මුස්ලිම් ජනතාවට එරෙහිව හා වර්තමානයේදී විරුද්ධ මතධාරීන්ට එරෙහිව බවත් එම නිවේදනය අවධාරණය කරයි.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත මුළුමනින්ම අහෝසි කරන ලෙස හා එතෙක් එම නීතිය ක්‍රියාත්මක කිරීම අත්හිටුවන ලෙස එමගින් ඉල්ලා සිටී.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ස්ථාවරය වී ඇත්තේද ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත මුළුමනින්ම අහෝසි කළ යුතු බවයි.

මූලාශ්‍ර: 1. https://theleader.lk
2. https://www.newindianexpress.com

2. **යෝජිත දත්ත ආරක්ෂණ පනත සංශෝධනය කිරීම සඳහා මැදිහත් වන ලෙස ශ්‍රී ලංකා තරුණ ජනමාධ්‍යවේදීන්ගේ සංගමය අදහස් දැක්වීමේ සහ ප්‍රකාශනයේ නිදහස පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරුගෙන් ඉල්ලා සිටීම.**

යෝජිත පනත මගින් අධිකරණයක් නොවන ආයතනයකට දඬුවම් නියම කිරීමේ බලය ලබාදීම, තොරතුරු පනතේ ප්‍රතිපාදන හීන කිරීම සහ ජනමාධ්‍ය ක්‍රියාකාරකම්වලට දැඩි බලපෑමක් සිදු වීම යනාදී කරුණු පෙබ. 15 දාතමින් යොමු කළ එම ලිපියෙන් පෙන්වා දී තිබේ.

තරුණ ජනමාධ්‍යවේදීන්ගේ සංගමය, මෙම පනත් කෙටුම්පත සංශෝධනය කරන ලෙස ඉල්ලමින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සියලුම මන්ත්‍රීවරුන් වෙත ලිපියක් යොමු කළ අතර පනත් කෙටුම්පතට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ පෙත්සමක් ගොනු කළද 'පනත් කෙටුම්පත ඉදිරිපත් කර දින 7ක කාල සීමාව ඉක්මවීම' යන කරුණ මත එය නිශ්ප්‍රභ කෙරිණි.

මූලාශ්‍රය: https://medialk.com

3. **ජනමාධ්‍යවේදීන්ට හා ක්‍රියාකාරිකයන්ට එල්ල වන තර්ජන වර්ධනය වීම පිළිබඳව විපක්ෂ නායකවරයා පාර්ලිමේන්තුවේදී විශේෂ ප්‍රකාශයක් සිදු කිරීම.**

වත්මන් රජය යටතේ සිදුවෙමින් පවතින මාධ්‍ය මර්දනය වහාම නැවැත්විය යුතු බවත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ම සහතික කර ඇති භාෂණයේ නිදහස තහවුරු කළ යුතු බවත් විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස, පෙබරවාරි 22 වැනිදා පාර්ලිමේන්තුවේදී විශේෂ ප්‍රකාශයක් කරමින් අවධාරණය කළේය. පවතින රජය යටතේ මාධ්‍යවේදීන්ට හා නිදහස් අදහස් පළ කරන්නන්ට එල්ල වූ තර්ජන පිළිබඳ ලේඛනයක්ද විපක්ෂ නායකවරයා විසින් සභාගත කෙරිණි.

මූලාශ්‍ර: 1 https://www.youtube.com

2. https://sinhala.lankanewsweb.net

4. **LGBTIQA+ ප්‍රජාවට අදාළ මාධ්‍ය ආචාරධර්ම පිළිබඳව ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමය විසින් සංවිධානය කළ මාර්ගගත සංවාදයක් ජනමාධ්‍යවේදීන් උදෙසා පැවැත්වීම.**

'ලිංගිකත්වය, සමාජභාවය හා ජනමාධ්‍ය වාර්තාකරණය' මැයෙන් පැවැත්වුණු මෙම සංවාදයේදී LGBTIQA+ ප්‍රජාව පිළිබඳ නිවැරදි ලෙස අවබෝධ කර ගැනීම හා එම ප්‍රජාව පිළිබඳ වාර්තාකරණයට අදාළ මාධ්‍ය ආචාරධර්ම පිළිබඳව අවධානය යොමු කෙරිණි. මෙම සංවාදයේ සම්පත්දායක ලෙස, එම විෂය පිළිබඳ පර්යේෂකයකු හා පුහුණුකරුවකු වන දමිත් චන්දිමාල් සහභාගී විය.

සංවාදයට සවන්දීම සඳහා: https://www.facebook.com

**5 වගුව: මාධ්‍ය නිදහස: 2022 ජනවාරි-පෙබරවාරි දක්වා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය වෙත වාර්තා වී ඇති සිදුවීම්.**

| ආවරණය කර ඇති සංරචකය | 2022 ජනවාරි | | 2022 පෙබරවාරි |
|---|---|---|---|
| | නව සිදුවීම් | පෙර සිදුවීම්වල වර්ධනයන් | |
| ආරක්ෂාව හා සුරක්ෂිතබව | 04 | | 05 |
| නීතිමය කොන්දේසි | 06 | | 06 |
| ව්‍යුහාත්මක කොන්දේසි | 14 | | 04 |
| **එකතුව** | **24** | | **15** |

2022 මාධ්‍ය නිදහස මාසික වාර්තාව ජනවාරි මෙතැනින් බලන්න

**පසුසටහන:** සිවිල් සමාජ අපේක්ෂාවන්, ජාතික හා ජාත්‍යන්තර නඩු තීන්දු සහ අන්තර්ජාතික ප්‍රඥප්තීන්ටද අනුව යමින්, මාධ්‍ය නිදහස යනු මානව අයිතියක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. සෑම තැනැත්තකුම සතු සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ නිදහස සහ ආගමික නිදහස මෙන්ම අන් තැනැත්තන්ගේ මත දැනගැනීමට තිබෙන මූලික අයිතිය බාධාවකින් තොරව භුක්තිවිඳීම මානව අයිතියකි. මෙම පදනම මත පිහිටා මාධ්‍ය නිදහස යනු පහත දැක්වෙන දසවැදෑරුම් සංඝටකවල එකතුවක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සලකයි. (1) සිතීමේ නිදහස (2) මතයක් දැරීමේ නිදහස (3) භාෂණයේ නිදහස (4) සාමකාමීව රැස්වීමේ නිදහස ඇතුළු අදහස් පළ කිරීමේ නිදහස (5) තොරතුරු දැනගැනීමේ නිදහස (6) ශ්‍රව්‍ය, දෘශ්‍ය පටිගත කිරීමේ සහ වාර්තා තබා ගැනීමේ නිදහස (7) ප්‍රකාශනයේ නිදහස (8) පුවත්පත් නිදහස (9) විද්‍යුත් මාධ්‍ය නිදහස (10) අන්තර්ජාල නිදහස යනු එම සංඝටකයන්ය. මෙම සංඝටක අතර ඇත්තේ සහජීවී සම්බන්ධයක් වන අතර එක් සංඝටකයක ඇති වන සීමාවක් මාධ්‍ය නිදහස පිළිබඳ අනෙක් සියලුම සංඝටකයන් භුක්තිවිඳීමේ නිදහස අහුරන බව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. එමෙන්ම වගකීම් විරහිතව හා වෛරී සහගත ලෙස එම නිදහස භාවිත කිරීම යහපත් භාවිතාවක් නොවන බවද නිදහස් මාධ්‍ය ව්‍යාපාරය අවධාරණය කරයි.

මෙම මාසික වාර්තා පිළියෙල කරනු ලබන්නේ ජනමාධ්‍ය වාර්තා සහ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයට ලබා ගත හැකි තොරතුරු අනුව වැඩිදුර තොරතුරු සොයා එම සිදුවීම් විශ්ලේෂණය කිරීමෙනි. මෙම විශ්ලේෂණයේදී නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ඉහත කී දසවැදෑරුම් මාධ්‍ය නිදහස් සංඝටකයන් ආවරණය කරන ජාත්‍යන්තරව පිළිගත් සංරචකයන් හතක් ඔස්සේ තෝරා ගත් නිර්ණායක භාවිත කරයි.


## Free Media Movement

Convener: Lasantha De Silva +94 71 166 7938, +94 77 810 7620 | Secretary: Hana Ibrahim +94 77 741 2995
Treasurer: Ananda Jayasekara +94 77 312 4850
No 96, Bernard Soysa Mw, Colombo 05. Tel: +94 112368895 Fax: +94 112368895;
Web: www.fmmsrilanka.lk, www.mediareform.lk
Email: fmmsrilanka@gmail.com | Facebook: https://www.facebook.com/fmm.srilanka
Twitter: https://twitter.com/FMMsrilanka | #FMM25